පොදු චක්‍රලේඛ අංක: 01-18/2015

## සෞ.වෛ.නි. කොට්ඨාශ තුළ ප්‍රාදේශීය රැස්වීම් පැවැත්වීම

සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ මට්ටමින් මසකට වරක් ප්‍රාදේශීය රැස්වීම පැවැත්විය යුතු අතර එමගින් කාර්යසාධනය ඇගයීම, කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය, ගැටළු හඳුනා ගැනීම, විසඳුම් සෙවීම, ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සමඟ අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කර ගැනීම, ක්ෂේත්‍රයේ මහජනතාවගේ පැමිණිලි පිළිබඳ සාකච්ඡා කර විසඳුම් සෙවීම ආදි කාර්යයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

### 01. ප්‍රාදේශීය රැස්වීම පහත අරමුණු සපුරා ගැනීම සඳහා පැවැත් විය යුතුය.

- ප්‍රාදේශීය මට්ටමේදී සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන කාර්යමණ්ඩල සමඟ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම
  මහජන සෞඛ්‍ය පරික්ෂක සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි ආදි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් , ප්‍රාදේශීය මට්ටමේදී සෞඛ්‍ය නොවන කාර්යමණ්ඩල සමඟ සම්බන්ධීකරණය කිරීම තුලින් තව දුරටත් ශක්තිමත් කිරීම. එමගින් සේවා සැපයීමේ ගුණාත්මක බව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
- කාර්යසාධනය සුපරීක්ෂණය කිරීම
  දත්ත උත්පාදනය මත පදනම් ඒක පුද්ගල කාර්ය සාධන සමාලෝචන සහ අධීක්ෂණ ප්‍රතිපෝෂණ තුලින් දුර්වල ස්ථාන හඳුනා ගැනීම සහ සාකච්ඡා කිරීම.
- ප්‍රජනක, මානසික, නවජන්ම, ළදරු ළමා, නව යෞවන සහ යොවුන් සෞඛ්‍ය සේවාවන්, පවුල් සැලසුම් ක්‍රියාකාරකම් පාසල් සෞඛ්‍ය, පාරිසරික සහ වෘත්තිය සෞඛ්‍ය පිළිබඳ තොරතුරු සහ මහජන සෞඛ්‍ය පිළිබඳ විශේෂිත කාර්යයන් සහ අනෙකුත් අදාල ක්‍රියාකාරකම් ඇගයීම.
- සේවා සැපයීමේදී ඇති වන ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා සාකච්ඡා මාර්ගයෙන් විසඳීම් ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමේ කාර්ය මණ්ඩලය තුල කණ්ඩායම් හැගීම් සංකල්පය වැඩි දියුණු කිරීම.

### 02. ප්‍රාදේශීය රැස්වීම පැවැත්විය යුතු දිනය සහ වේලාව

- සෑම මසකම නියමිත දිනකදී මෙම රැස්වීම පැවැත් විය යුතුවේ.
- ප්‍රාදේශීය රැස්වීම් සඳහා අදාල දින සහ වේලාවන් වසර මුලදී සැලසුම් කර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ අනුමැතිය ලබා ගත යුතුවේ. මෙම වාර්ෂික සැලැස්ම ප්‍රා.සෞ.සේ. අධ්‍යක්ෂක හා අදාල ආයතන/නිලධාරීන් වෙත දැනුම් දිය යුතුය.
- හදිසි අවස්ථාවකදී දිනය වෙනස් කරන්නේ නම් ඒ සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ අනුමැතිය ලබා ගත යුතුය. එමෙන්ම අදාල ස්ථාන/නිලධාරීන් වෙත නියමිත දිනට සතියකට පෙර දැනුම් දිය යුතුය.
- වරුවක් මේ සඳහා යොදවා ගැනීම වඩා සුදුසු වන අතර ක්ෂේත්‍ර/සායන කාර්යයන් අවසානයේ සිදුකිරීම වඩා ඵලදායි වේ.

### 03. සහභාගිත්වය

පහත සඳහන් නිලධාරීනගේ සහභාගිත්වය අනිවාර්යවේ

- අදාල ක්ෂේත්‍රයේ මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි (ස්ථිර, වැඩ බලන, වැඩ ආවරණය කරන ඇතුළුව )
- අදාළ මහජන සෞඛ්‍ය පරීක්ෂක ක්ෂේත්‍රයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ සියළුම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන්
- අදාල අවස්ථාවන්හිදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහභාගී විය යුතුයි
- අනෙකුත් අදාල ප්‍රාදේශීය නිලධාරීන් - ග්‍රාම නිලධාරී, සමූර්ධි නිලධාරී, ස්වේච්ඡා කණ්ඩායම් නායකයින් (උදා : මව් හවුල්)
- අවශ්‍යතාවය අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ අනෙකුත් අදාල නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්වයන්

### 04. ක්‍රමවේදය

- මහජන සෞඛ්‍ය පරීක්ෂක ක්ෂේත්‍ර මට්ටමින් ප්‍රාදේශීය රැස්වීම පැවැත්විය යුතු අතර එම ක්ෂේත්‍රය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ප්‍රාදේශීය රැස්වීම සංවිධානය කළ යුතුය.

- රැස්වීමේ සම සභාපතිත්වය මහජන සෞඛ්‍ය හෙද සොයුරිය සහ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක වන අතර ක්ෂේත්‍රය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක කැඳවුම්කරු ලෙසද, වාර්තා තැබීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් ලේකම් වශයෙන්ද කටයුතු කළ යුතුවේ. ලේකම් තනතුර වාර්ෂිකව මාරු කළ යුතුවේ.
- ලේකම් විසින් රැස්වීමේ වාර්තාව ඊ ලග මාසික රැස්වීමට ඉදිරිපත් කර සාකච්ජා කළ යුතුය.
- ප්‍රාදේශිය රැස්වීම, සැලසුම්ප්‍රකාර සහ ඵලදායි අයුරින් පවත්වන බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහතික විය යුතුයි.

## 05. ක්‍රියාකාරකම්

**පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළත් විය යුතුය**

- ශක්තිමත් හා දුර්වල ස්ථාන හඳුනා ගැනිම සඳහා සෑම මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙක්ම සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක්ම සම්පූර්ණ ඇගයීමකට ලක් කළ යුතුය. ඒ සඳහා තෝරා ගන්නා ලද දර්ශක කිපයක් හෝ අධීක්ෂණ නිර්දේශයන් භාවිතා කළ හැකිය. මෙසේ හඳුනා ගත් ගැටළු විසඳා ගැනිම සඳහා ගත යුතු පියවර, මහජන සෞඛ්‍ය හෙද සොයුරිය හෝ පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය හෝ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමඟ සාකච්ජා කිරිම. මෙම ඇගයීමේදී නිලධාරි/ නිලධාරිනියන්ගේ අදාළ ලේඛණ, වාර්තා, අධීක්ෂණ වාර්තා ආදිය තිබිය යුතුවේ.
- සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරිමට මෙම සාකච්ජා ප්‍රාදේශිය මට්ටමේදී පැවැත්විය යුතුවේ. උදා : පාසල් ළමුන් අතර හඳුනා ගත් ආබාධ පසු විපරම් කිරිම, විශේෂ අවශ්‍යතා සහිත පවුල් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනිම , සායන මධ්‍යස්ථාන වලින් තොරතුරු ලබා දිම ආදිය
- මෙම රැස්වීමේ ගන්නා ලද තිරණ මත ඊලග මස ඉදිරි කාලසටහන සකස් කල යුතුය.
- ප්‍රාදේශිය මට්ටමේදී හඳුනා ගත් විශේෂ සමීක්ෂණ හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම හා වාර්තා තැබීම කළ යුතුවේ.
- කණ්ඩායම් හැගිම ඔප් නැංවෙන විශේෂ ක්‍රියාකාරකම් සඳහා උනන්දු විය යුතුයි.

**පොදු උපදෙස්**

06. ප්‍රාදේශිය රැස්වීම් වල වාර්තා සාකච්ජා කිරිම සඳහා ඊලඟ මාසික රැස්වීමට ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තා ඊ ලඟ ප්‍රාදේශිය රැස්වීමෙදදී ඉදිරිපත් කළ යුතුය.

07. පුරප්පාඩු සහිත ක්ෂේත්‍ර ඇති විට සුදුසු පරිදි ප්‍රාදේශිය රැස්වීම් පැවැත්වීම පිළිබඳ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට තිරණය කලහැකි වේ. එමෙන්ම ප්‍රාදේශිය රැස්වීම් නිසි පරිදි සිදු වන බවට වග බලා ගැනිම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ කාර්යභාර්ය වේ.

08. සියළුම ප්‍රාදේශිය රැස්වීම් වල සාරාංශය ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂක වෙත යැවිය යුතුවේ.

09. වාණිජ අරමුණු සහිත පුද්ගලයින් සහ පුද්ගලික අරමුණු ඉටු කරගැනිම සඳහා පැමිණෙන පුද්ගලයින් මෙම රැස්වීමට සහභාගිකර නොගත යුතුයි.

10. කාර්යසාධන සංවර්ධනයෙහිලා, ප්‍රාදේශිය රැස්වීමේදී සිදු කරන ඇගයීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යමණ්ඩල ඇගයීමක් ලෙස සැලකිය හැකිය.

..............................................................

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය